
# තෙවන තේමාව - දේව පණත් පිළිපදිමින් නීතිගරුක හා සදාචාර සම්පන්න ජීවිතය

19

## 3.3. සිතින් නිර්මල ව ක්‍රියාවෙන් පිරිසිදුව

- ලොව කෙතරම් සංකීර්ණ වුව ද ශුද්ධවත් ව හා එකමුතු ව දිවි ගෙවීමෙන් සියලු බාධා ජය ගත හැකි ය.




**මේ ශීර්ෂ පාඨවලින් ඔබට හැඟෙන අදහස් මොනවාද?**

ක්‍රිස්තුන් වහන්සේගේ අරමුණ සියලු මනුෂ්‍ය වර්ගයාට ම ස්වර්ගික සැපත ලබාදීම යි. මෙම අරමුණ කරා ළඟා වීම සඳහා අපට මෙලොව ජීවිතය ලබා දී තිබේ. එසේ නම් අසාමාන්‍ය ජීවිතයක් නොව සාමාන්‍ය ජීවිතයක් තුළ අසල්වැසියන්ට ප්‍රේම කිරීම මගින්

මෙලොව ජීවිතය ගත කළ හැකි ය.

ශුද්ධවන්ත ජීවිතය පැවිදි අයට පමණක් නොව සියලු ම දෙනාට අයිති ය. අපගේ ජීවිත තත්ත්වය අනුව ක්‍රියාකර දෙවියන් වහන්සේට ආදරය කිරීමට අපට හැකි ය. අප දස පනතට අනුව ආධ්‍යාත්මික ජීවිතයක් ගත කිරීම තුළින් අපට දෙවියන් වහන්සේට ආදරය කළ හැකි වෙයි.


අපට කැඳවීම ලැබී ඇත්තේ දෙවියන් වහන්සේ මෙන් ශුද්ධවන්ත ජීවිතයක් ගත කිරීම සඳහාය.

> "ළදරුවන් මා වෙත එන්නට ඉඩ දෙන්න. ඔවුන් නො වළකන්න. මන්ද දෙවියන් වහන්සේගේ රාජ්‍යය මෙබඳු වූවන්ගේ ය."
>
> (මතෙව් 5:8)


කුඩා දරුවන් තුළ කිසිම අයහපතක් නැත. වංචාවක් නැත. ඔවුන් නිර්මල යි. අප ද දෙවියන් වහන්සේ දැකීමට නම් කුඩා දරුවන් වගේ විය යුතු ය.



නරක දේ බලන්න එපා



නරක දේ කියන්න එපා



නරක දේ අහන්න එපා

**හොඳ දේ අහන්න,**
**හොඳ දේ දකින්න**
**හොඳ දේ සිතන්න**

පුද්ගලයාගේ මෙන්ම පවුලේ පාරිශුද්ධියත්, ස්ථාවරත්වයත් සඳහා පිළිපැදිය යුතු ආචාරධර්ම දෙකක් කිතුනු සාරධර්ම වශයෙන් ඔබට මෙයින් ඉදිරිපත් කෙරේ. විවාහක යුවතිපතීහූ පතිවත හා පතිනිවත රැකිය යුත්තෝ ය. ඊට පටහැනි කුමන ක්‍රියාවක් හෝ කිරීමත් එවැන්නක් සඳහා ඇලුම් වීමත් සමාජ විරෝධී ය. ඒ නිසා ම දේව විරෝධී ක්‍රියා බව මෙයින් ඔබට මතක් කර දෙයි.


**පාවුළුතුමාගේ මෙම අවවාදය කියවන්න.**

ඔබගේ ශරීරය, ඔබට දෙවියන් වහන්සේ දෙවා වදාළ, ඔබ තුළ වැඩ වසන ශුද්ධාත්මයාණන්ගේ මන්දිරය වන බව ඔබ නො දන්නාහු ද?

(1 කොරෙන්ති 6:19)

මනුෂ්‍ය ශරීරය ශුද්ධ වස්තුවකි. එම නිසා ස්වකීය ශරීරය පිළිබඳ ව ගෞරවනීය හැඟීමක් කිතුනුවා තුළ තිබිය යුතු ය.

කිතුනුවාගේ ඇඳුම විනීත විය යුතු ය. හැසිරීම සංවරශීලී විය යුතු ය. කතා බහ යහපත් විය යුතු ය. හැඟීම්වලට වහල් නොවී චරිත පාරිශුද්ධිය රැක ගැනීමේ ආත්ම ශක්තිය තිබිය යුතු ය.




"නිර්මල සිත් ඇත්තෝ භාග්‍යවන්තයෝ ය. ඔව්හු දෙවියන් වහන්සේ දකින්නෝ" යැයි ජේසුස් වහන්සේ අනුශාසනා කරන්නේ චරිත පාරිශුද්ධිය ඇති උදාර මානවීය ගුණාංගයන් බව කිතුනුවාට පසක් කරවීමටය. මෙම ඉගැන්වීම තව දුරටත් දැන ගැනීම සඳහා මතෙව් 5:2730 දක්වා කියවන්න.


මිනිසාගේ ශාරීරික මානසික වෙනස්වීම ස්වභාවිකව සිදු වන දෙයකි. වයසට අනුව වෙනස්වීම් සිදුවෙමින් පවතී. එයට විරුද්ධ ව ක්‍රියාකිරීම, පහත් හැඟීමක් ඇති කර ගැනීම දෙවියන් වහන්සේ නින්දාවට පත් කිරීම හා සමාන ය. එම නිසා අපගේ ශාරීරික වර්ධන දෙවියන් වහන්සේට එකඟ ව ක්‍රියා කිරීමට අප සතු වගකීමක් වන බව සිහි තබා ගත යුතුයි.

පරදාර සේවනය කරන්නා අනුවණයෙකි. ඔහු තම ජීවිතය නාස්ති කරන්නෙකි.

(හිතෝපදේශ 6:32)

- පවුල් ජීවිතයේ ශුද්ධවන්තභාවයට එල්ලවන අභියෝග හිස් කොටු මත ලියන්න.

**වැඩිදුර දැනුම සඳහා**




- ශු. මරියාගොරෙට්ටි තුමිය
- ශු. ඇග්නස්තුමිය යන අයගේ ජීවිත කථා කියවන්න.

> නිර්මල සිත් ඇත්තෝ භාග්‍යවන්තයෝ ය.
> ඔවුහු දෙවියන් වහන්සේ දකින්නෝ ය.
> (මතෙව් 5 : 8)

දෙවියන් වහන්සේ දැකීම සඳහා ඔබ චරිතායනය කර ගත යුතු ගුණාංග මොනවා දැ යි සාකච්ඡා කරන්න.

**මැරෙන්නට සිදුවුනත් මාගේ දේව ජීවිතය නැති කරගන්නේ නැත.**



ඇගේ වයස අවුරුදු 12කි. පියාගේ මරණයෙන් පසු ඇය මව සමග ගෙදර වගකීම් බාර ගත්තා ය. බාල නංගිලා මල්ලිලා රැක බලාගෙන, දෙවියන් වහන්සේට ආදරය කරන සැටි, යාච්ඤා කරන සැටි ඔවුන්ට ඉගැන්වූවා ය. මෙලෙස මරියා වයසින් වැඩෙන විට ආත්මිකව ද ශාරීරිකව ද වඩ වඩා ලස්සන වූවා ය.

දිනක් මරියා ගොරෙත්ති ගෙදර තනිව ම සිටින විට එක් පව්ටු පුද්ගලයෙක් ඇය පාපයට පොළඹවා ගන්නට උත්සාහ කෙළේ ය. මරියා එයට තදින් ම විරුද්ධ වූ නිසා කෝපයට පත් පව්ටුවා පිහියකින් ඇන ඇයට මාරක තුවාල සිදු කෙළේ ය.

මරණයට පෙර මරියා තම මෑණියන් අමතා මෙසේ කීවා ය. "අම්මේ, මම පළමුවරට දිව්‍යසත්ප්‍රසාදය ලැබූ දා ජේසුට දුන් පොරොන්දුව ඉටුකළා. මරණයට පත් වුනත් මම මගේ දේව ජීවිතය නැති කර ගත්තේ නෑ."